(31)

232915

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1991 අංක 32 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 අගෝස්තු මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 අගෝස්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල: ශත 45 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

២០២៩១៦

1991 අංක 32 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 අගෝස්තු මස 16 වන දින]

එල්. ඩී—ඕ 1/90

දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1991 අංක 32 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය. කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. දණ්ඩ නීති සංග්‍රහයේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 19 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්;

(2) නැවත අංක කළ (1) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:—

"(2) මේ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව කරන ලද්දා වූ හෝ කිරීම පැහැර හරින ලද්දා වූ ද ඒ විධිවිධාන යටතේ ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් තමා වරදකරු විය යුතු වූ ද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්—

(අ) ශ්‍රී ලංකා ජනරජයෙන් බැහැරව පිහිටියා වූ ශ්‍රී ලංකා දූත මණ්ඩලයක පරිශ්‍රය තුළ හෝ ඒ දූත මණ්ඩලයේ ප්‍රධානියාගේ හෝ තානාපති අනුයෝජිතයාගේ හෝ ඒ දූත මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුගේ වාසස්ථානය ඇතුළත සිදුකළ; හෝ

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් හෝ එහි පාලනය යටතේ නැතහොත්, ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වෙනුවෙන් හෝ එහි පාලනය යටතේ පදිංචිය දරන්නා වූ ද ශ්‍රී ලංකා ජනරජයෙන් බැහැරව පිහිටියා වූ ද යම් පරිශ්‍රයක් ඇතුළත සිදුකළ; හෝ

(ඇ) විදේශ රාජ්‍යයක් විසින් යම් ශ්‍රී ලංකා ජාතිකයකුට, ඔහුගේ තානාපති තත්වය නිසා ප්‍රදානය කරන ලද තානාපති පරිහාරය ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් භුක්තිවිඳින අවස්ථාවක,

ශ්‍රී ලංකාවෙන් බැහැරව, සිදුකළ සෑම ශ්‍රී ලංකා ජාතිකයකුම මේ සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය යුතුය;

2—ඩී 012987—5,625 (91/04)

(3) යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් කරනු ලැබුවේ යම් රටක දී ද ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් ඒ රටේ නීතිය යටතේ යම් ශ්‍රී ලාංකික ජාතිකයකුගේ වගකීම කෙරෙහි මේ වගන්තියේ කිසිවක් බල පාන්නේ යයි තේරුම් නොගත යුතුය.''; සහ

(3) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට, පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැරව සිදුකළ වැරදි සම්බන්ධයෙන් වගකිවයුතු බව.".

**අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

| [illegible] | | | |
|---|---|---|---|
| 08 | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |